056137
ML/PR
2017/12/11
0081

# වර්තමාන ශ්‍රී ලංකාවේ ළමා අපරාධ අවම කිරීම සඳහා සෞන්දර්ය විෂයයෙන් ලැබෙන අනුබලය

ලියාපදිංචි අංකය : DD/MA/DA/08/021

නම : බී.ඒ.එල්. අජන්තා

056137

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන පීඨයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධනය.

2008/2009

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කොළඹ

# සාරාංශය

නවීකරණයක් සමඟම සාරධර්ම ගුණධර්ම පිරිහී යන්ත්‍ර සූත්‍ර වැනි හිතක් පපුවක් නැති මිනිසුන් නිර්මාණය වන සමාජයක අපරාධ නොතිබුණහොත් එය පුදුමයකි. ශ්‍රී ලංකාවේ මෙවන් සමාජ පෙරළියක් සමඟ අපරාධ ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. ඒ අතර ළමා අපරාධයන් ද බොහෝ ය. වර්තමානයේ දී නිතර ළමා අපරාධයන් අසන්නට දකින්ට ලැබීම හේතුවෙන් මෙන්ම සෞන්දර්ය විෂයයේ වටිනාකම හඳුනාගත් නිසා ද අප ළමා අපරාධ ප්‍රමාණයන් අවම කර ගැනීම, සෞන්දර්ය විෂයයන් පිළිබඳව සමාජයේ අවතක්සේරුවකින් යුතුව බැලීම ද එහි වටිනාකම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව සඳහා අවශ්‍ය කරන පසුබිම සකසා ගත හැකි ක්‍රමවේදයක් පිළිබඳව අධ්‍යයනය කිරීම අපගේ අරමුණ විය. අපරාධ අවම කර ගැනීම සඳහා "සෞන්දර්ය විෂයයයෙන් ලැබෙන අනුබලය" මාතෘකාව වශයෙන් තෝරා ගන්නා ලදී.

පළමු පරිච්ඡේදයේ දී අපරාධ හා බාල අපරාධ වශයෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි හඳුනාගැනීමට නිර්වචනයන් ද ඇතුළු කොට ඇත.

දෙවන පරිච්ඡේදයෙන් බාල අපරාධ වර්ගීකරණයක් සිදු කර ඇත. ඒ සඳහා ළමා හා කාන්තා කාර්යාංශයෙන් ලද තොරතුරු පාදක කරගෙන ඇත. එහිදී බාල අපරාධ අතර සුළු අපරාධ හා ග්‍රහණ අපරාධ වශයෙන් දෙකොටසකි. සුළු අපරාධ ගණයට පහරදීම්, තුවාල කිරීම්, ලිංගික අතවර කිරීම්, ළමයින්ට අදාළ ව පලකරන ලබන අසභ්‍ය පල කිරීම් හා ප්‍රදර්ශනද, ළමයින් සිඟාකෑමට සැලැස්වීම හා ළමයින් කුලියට ගැනීම, ලිංගික සංසර්ගය හා කුට්ටනිකයෙකු ලෙස ක්‍රියා කිරීමට ළමයි කුලියට ගැනීම හෝ මෙහෙකාර සේවයේ යෙදීමත් මෙහෙකාර සේවය හා නුසුදුසු භාරකාරත්වය, ඇතැම් වැරදිවලට අදාළ කරුණු මාධ්‍යයෙන් පලකිරීම ද අවුරුදු 14ට අඩු ළමයින්ට අධ්‍යාපනය ලබා නොදීම, පරිභව කිරීම, බැන තර්ජනය කිරීම හා බිය ගැන්වීම ද ආදී වැරදි සාකච්ඡා වී ඇත. ග්‍රහණ අපරාධ ලෙස මිනී මැරීම, මිනී මැරීමට තැත් කිරීම, බරපතල තුවාල කිරීම, කුට්ටනය ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, පැහැරගෙන යාම, අපහරණය දූෂණය කිරීම, අස්වාභාවික වැරදි, බරපතල ලිංගික අපයෝජනය, ව්‍යාභිචාරය, කෲරත්වයට පත් කිරීම, දැඩි අශිෂ්ඨ ක්‍රියා ව්‍යාභිචාරයට තැත් කිරීම ආදී වශයෙනි. විස්තර කර ඇති ඕනෑම අපරාධයක් සඳහා ළමයින් හැදෙන වැඩෙන පරිසරයේ තත්ත්වය පිළිබඳව විස්තර කර ඇත. ළමා නිවාස තුළ සිටින දරුවන් අතීතයේ ඔවුන් ජීවත් වූ පරිසරයන් ආදිය ඔවුන්ගේ අපරාධ ක්‍රියා සඳහා බලපාන ඇති ආකාරය සාකච්ඡා කොට ඇත. ළමයින් යම් වරදක් සිදු කළ විට නීතිය ක්‍රියාත්මක වන ආකාරය සාකච්ඡා කොට ඇති අතර 2005-2010 දක්වා අවුරුදු 6ක ලංකාවේ විවිධ ප්‍රදේශවල සිදුව ඇති අපරාධයන් දත්ත වශයෙන් එක් කරමින් සාකච්ඡා කොට ඇත.

තුන්වන පරිච්ඡේදයේ දී සෞන්දර්යය යන්න පිළිබඳ විවිධ දාර්ශනිකයින්ගේ අදහස් ඇතුළුව නිර්වචනය කොට සෞන්දර්ය නැවත බාණ්ඩ වන ආකාරයන්, පාසැල් අධ්‍යාපනයේ දී ක්‍රියාත්මක වන ආකාරයත් අතීතයේ ගුරුගෙදර අධ්‍යාපනයේ සිට වර්තමානයේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳව ද සාකච්ඡා කොට ඇත. එහිදී සෞන්දර්ය විෂය ඉගෙනීමේ වටිනාකම හා පෞරුෂය වර්ධනය වන ආකාරයත් තත් විෂයයන් ඉගෙනීමෙන් ජීවිතයට ප්‍රයෝජනවත් වන ආකාරයත් පැහැදිලි කොට ඇත.